පහත සඳහන් අයුරින් නිවැරදි විය යුතුයි. වෙන්දේසි දිනය 2008.02.07 පෙ. ව. 11.30 ට මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

විමසීම් :

කළමනාකරු,
කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ්,
අංක 143/බී, නුවර පාර, කඩවත,
දුරකථන : 2921456 - 7, 2921454
ෆැක්ස් : 2921455.

එල්. බී. සේනානායක,
ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු, තක්සේරුකරු
උසාවි කොමසාරිස්, කොළඹ
වාණිජ්‍ය මහාධිකරණය සහ දිසා අධිකරණය,
රාජ්‍ය සහ වාණිජ්‍ය බැංකු
අංක 99, උසාවිය පාර, කොළඹ 12.
දුරකථන/ෆැක්ස් : 2445393.

01 - 56

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස : I වැනි ඡේදය - සාමාන්‍ය

ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 46

DRF/21/RECT/2517.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජුනි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

බ්‍රිගේඩියර් මුවගමගේ මෝහන්දාස් සුමනසේන, යූඑස්පී (නි/50738).

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් ජ්‍යෙෂ්ඨ නිලධාරියා 2007 ජුනි මස 30 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

බ්‍රිගේඩියර් මුවගමගේ මෝහන්දාස් සුමනසේන, යූඑස්පී (නි/50738).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
කොළඹ දී ය.
01-794

2008 අංක 53

DRF/21/RECT/2524.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් ලියනාරච්චිගේ කෙනත් ගයාන් රණසිංහ, ආර්එස්පී ශ්‍රීලපාහ (නි/63279).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දීය.

01-800

ඩීආර්එෆ්/21/ආර්ඊසීටී/2536.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ අධිකාරියෙන් ඉවත් කිරීමක්

නිල පහත හෙළීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2004 ඔක්තෝබර් මස 21 වැනි දින සිට කපිතන් නිලයට නිල පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත:

කපිතන් (තාවකාලික මේජර්) විජේබාහු මුදියන්සේලාගේ අනුරුද්ධ චාමික විජේබාහු විපාරෙ (නි/62206).

අධිකාරියෙන් ඉවත් කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2004 ඔක්තෝබර් මස 22 වැනි දින සිට අධිකාරියෙන් ඉවත් කරනු ලැබීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් විජේබාහු මුදියන්සේලාගේ අනුරුද්ධ චාමික විජේබාහු විපාරෙ (නි/62206).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින, කොළඹ දී ය.
01-817

2008 අංක 47

DRF/21/RECT/2523.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක් සහ විශ්‍රාම ගැනීමක්

නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 30 වැනි දින සිට මේජර් නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (තාවකාලික මේජර්) හේවා මාරඹගේ හර්ෂ චානක පෙරේරා, ආර්එස්පී ශ්‍රීලසබ (නි/60298).

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 31 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් හේවා මාරඹගේ හර්ෂ චානක පෙරේරා, ආර්එස්පී, ශ්‍රීලසබ (නි/60298).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.
01-801

2008 අංක 54

ඩීආර්එෆ්/21/ආර්ජීසීවී/2503.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 20 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් අධිකාරි මුදියන්සේලාගේ ලාල් උපතිස්ස සබුබ (නි/63798).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.
01-816

2008 අංක 48

DRF/21/RECT/2531.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීමක්, විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

නිල ස්ථිර කිරීමක්

පහත නම සඳහන් නිලධාරියා 2007 මැයි මස 15 වැනි දින සිට මේජර් (උපකරණ පාලක) නිලයේ ස්ථිර කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක) (තාවකාලික මේජර්) (උපකරණ පාලක) විබද්දේ හේරත් මුදියන්සේලාගේ විජේකෝන් බණ්ඩා ගැහේබ (නි/61580).

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 මැයි මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

මේජර් (උපකරණ පාලක) විබද්දේ හේරත් මුදියන්සේලාගේ විජේකෝන් බණ්ඩා ගැහේබ (නි/61580).

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2007 මැයි මස 16 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් (උපකරණ පාලක) විබද්දේ හේරත් මුදියන්සේලාගේ විජේකෝන්බණ්ඩා ගැහේබ (නි/61580).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.
01-802

2008 අංක 50

DRF/21/RECT/2506.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2006 නොවැම්බර් මස 29 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් රස්නක රාලලාගේ විරාජ් තුල්ෂාන් කරුණාතිලක ශ්‍රීලංසිරෙ (නි/61573).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 අප්‍රේල් මස 10 වැනි දින,
කොළඹ දී ය.
01-796

2008 අංක 56

DRF/21/RECT/2541.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 ජුනි මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් ආභරන ගෙදර සරත් ගුණසිංහ ශ්‍රීලයුපොහේබ (නි/63958).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.
01-797

2008 අංක 51

DRF/21/RECT/2526.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 පෙබරවාරි මස 28 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් සුමේධ ලංකාජීව මිරිහාන ගරෙ(නි/63978).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.
01-798

2008 අංක 52

DRF/21/RECT/2520.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 01 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් විජයමුනි අමල් නිශාන් ද සිල්වා, ආර්එස්පී ශ්‍රීලකාහ (නි/64136).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.
01-799

2008 අංක 58

DRF/21/RECT/2525.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියෙන් ඉල්ලා අස්වීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ පහත නම සඳහන් නිලධාරියා 2007 මාර්තු මස 31 වැනි දින සිට අධිකාරියෙන් ඉල්ලා අස්වීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

ලුතිනන් ලොරෙන්සු හේවා වැල්ලේ කම්කානම්ගේ චම්ල් ප්‍රසාද් ශ්‍රීලසබ (නි/65286).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.
01-804

2008 අංක 55

DRF/21/RECT/2529.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක් සහ ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන්(උපකරණ පාලක) පඩුවාවල කංකානම්ලාගේ ආනන්ද කුමාරසිරි පඩුවාවල, යූඑස්පී ශ්‍රීලංඉ (නි/62655).

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 23 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක) පඩුවාවල කංකානම්ලාගේ ආනන්ද කුමාරසිරි පඩුවාවල, යූඑස්පී ශ්‍රීලංඉ (නි/62655).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 17 වැනි දින,
කොළඹ දී ය.
01-795

2008 අංක 57

DRF/21/RECT/2124.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමිය විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරි 2003 මාර්තු මස 22 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමිය විසින් අනුමත කර ඇත :

ලුතිනන් (උපකරණ පාලක) දොඩන්ගොඩගේ දොන් මුනිරත්න, යූඑස්පී, ශ්‍රීලපාහ (නි/61638).

අතිගරු ජනාධිපති උතුමියගේ අණ පරිදි,
මේජර් ජෙනරල් අසෝක කේ. ජයවර්ධන,
ආර්ඩබ්ලිපී ආර්එස්පී වීඑස්වී යූඑස්පී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2005 මාර්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.
01-819

DRF/21/RECT/2534.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද නිල පහත හෙළීමක් සහ විශ්‍රාම ගැනීමක්

නිල පහත හෙළීම

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 14 වැනි දින සිට නිල පහත හෙළීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) ගිලීමලගේ බර්ටි නිහාල් දයාරත්න ඉසේබ (නි/60771).

විශ්‍රාම ගැනීම

පහත නම සඳහන් නිලධාරියා 2007 අප්‍රේල් මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවෙන් විශ්‍රාම ගැනීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

මේජර් ගිලීමලගේ බර්ටි නිහාල් දයාරත්න ඉසේබ (නි/60771).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 24 වැනි දින,
කොළඹ දී ය.
01-818

2008 අංක 49

DRF/21/RECT/2269.

ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව
අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීමක්

ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම

පහත නම සඳහන් නිලධාරියා 2006 මාර්තු මස 17 වැනි දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ නිත්‍ය (පොදු) උපසේවයට මාරු කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත :

කපිතන් (උපකරණ පාලක) සිරිල් රාජපක්ෂ ශ්‍රීලංසිරෙ (නි/62628).

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,
ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්ලිපී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2007 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.
01-803

අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය

2008 අංක 60

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

ශ්‍රී ලංකා විද්‍යාත්මක සේවයේ I වන පන්තියේ, ආචාර්ය එම්. ඉලංගසිංහ මහතා, 2007 අගෝස්තු මස 14 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

01-767

2008 අංක 61

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, එම්. බී. දිසානායක මහතා, 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරන තුරු මොණරාගල පරිපාලන දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්/දිසාපති වශයෙන්.

01-768

2008 අංක 59

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

ආචාර්ය ටී. ලලිතසිරි ගුණරුවන් මහතා 2007 මැයි මස 12 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වසර දෙකක කාලයක් සඳහා ඉඹිරිය සාමාන්‍යාධිකාරී වශයෙන්.

01-770

2008 අංක 62

අමාත්‍ය මණ්ඩලය විසින් පහත සඳහන් පත්වීම කර ඇත :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ, වයි එම්. අයි. කුමාරිහාමි මහත්මිය 2007 ඔක්තෝබර් මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත නියමයක් කරනතුරු උඩරට ගැමි පුනරුත්ථාපන දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වශයෙන්.

01-769

වෙනත් පත්කිරීම් ආදිය

2008 අංක 63

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ පත්කිරීම් :

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ඩබ්. ජී. වික්‍රමසිංහ මහතා, 2007.07.25 දින සිට නැවත නියමයක් කරනතුරු කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ ඩබ්. කොඩිතුවක්කු මහතා, 2007.10.24 දින සිට නැවත නියමයක් කරනතුරු කම්කරු දෙපාර්තමේන්තුවේ කොමසාරිස් වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ I වන පන්තියේ එච්. හේමචන්ද්‍ර මහතා, 2007.11.05 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු, සබඳතා හා මිනිස් බල අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ II වන පන්තියේ බී. සී. ආර්. බබා පජෝන් මහතා, 2007.10.02 දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ සී. එස්. එච්. විතානආරච්චි මහතා, 2006.01.17 දින සිට නැවත නියමයක් කරන තුරු ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ අයි. බී. ගුණවර්ධන මහත්මිය , 2006.06.01 දින සිට නැවත නියමයක් කරන තුරු ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ පී. එම්. නානායක්කාර මහතා, 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ පී. එල්. ජේ. ගුණරත්න මෙනවිය , 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ සී. ජේ. රාජකරුණා මහත්මිය , 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එච්. ඕ. ඩී. රෝහණ මහතා, 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු අධ්‍යාපන අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එච්. ඩබ්. පී. එස්. ජයතිස්ස මෙනවිය, 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ටී. ඩී. කුමාරදාස මහත්මිය, 2007.01.01 දින සිට නැවත නියමයක් කරන තුරු වෙළඳ, අලෙවි සංවර්ධන, සමුපකාර හා පාරිභෝගික සේවා අමාත්‍යාංශයේ අධ්‍යක්ෂවරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ඒ. හරින්ද්‍ර ලක්ෂාන් ද සොයිසා මහතා , 2007.01.09 දින සිට නැවත නියමයක් කරන තුරු ආපදා කළමනාකරණ හා මානව හිමිකම් අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ඩී. ඩී. එස්. ජයවර්ධන මහතා, 2007.01.29 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ටී. අයි. ඒ. සිරිවර්ධන මෙනවිය, 2007.01.29 දින සිට නැවත නියමයක් කරන තුරු ජාතිය ගොඩගැනීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අමාත්‍යාංශයේ සහකාර ලේකම්වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ යූ. ඩී. සීතා පද්මසිරි මහත්මිය, 2007.03.06 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස්වරියක/හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ අයි. පී. සුමනතිලක මහතා, 2007.03.06 දින සිට නැවත නියමයක් කරන තුරු ඉඩම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ හිමිකම් නිරවුල් කිරීමේ සහකාර කොමසාරිස්/හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එම්. පී. හේවාවිතාරණ මහතා, 2007.03.19 දින සිට නැවත නියමයක් කරන තුරු ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ සහකාර අධ්‍යක්ෂවරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ එන්. ඩබ්. ඩයස් මහත්මිය, 2007.04.03 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස්වරියක වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ඊ. එල්. කේ. පෙරේරා මහතා, 2007.04.03 දින සිට නැවත නියමයක් කරන තුරු කම්කරු දෙපාර්තමේන්තුවේ සහකාර කම්කරු කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ ආර්. එච්. කමල් මහතා, 2007.06.25 දින සිට නැවත නියමයක් කරන තුරු පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස්වරයෙකු වශයෙන්.

ශ්‍රී ලංකා පරිපාලන සේවයේ III වන පන්තියේ කේ. ජේ. එස්. මාධව මහතා, 2007.10.29 දින සිට නැවත නියමයක් කරන තුරු මැතිවරණ දෙපාර්තමේන්තුවේ සහකාර මැතිවරණ කොමසාරිස්වරයෙකු වශයෙන්.

ඩී. දිසානායක,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය.

2008 ජනවාරි මස 04 වැනි දින,
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
01-655

ආණ්ඩුවේ නිවේදන

1980 අංක 56, 1977 අංක 9, 1976 අංක 18 සහ 1974 අංක 34 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධන) නීතිවලින් සංශෝධිත 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ නීතියේ 20 වන වගන්තිය යටතේ නිවේදනය

ඉහත කී 1973 අංක 1 දරන නිවාස දේපළ උපරිමය පිළිබඳ (සංශෝධිත) නීතියේ විධිවිධානයන් ක්‍රියාත්මකවීම හේතුවෙන් මේ සමඟ ඇති උපලේඛනයේ විස්තරාත්මක ලෙසින් දැක්වෙන නිවස මා වෙත පැවරී ඇති බැවින්,

එකී නීතියේ 20 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මෙහි පහත උපලේඛනයෙහි විස්තර කරන ලද නිවාස මා වෙත සතු වූ දිනට පෙරාතුවම වූ දිනයෙහි එම නිවාසය හෝ නිවාස පිළිබඳ සම්බන්ධතාවයක් දැරූ සියලුම පුද්ගලයන් විසින් එම එක් එක් නිවාසය සඳහා සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසකට මෙම නීතිය යටතේ ගෙවිය යුතු මිල පිළිබඳ ලිඛිත හිමිකම් පෑම මෙම ගැසට් නිවේදනය ප්‍රසිද්ධ කළ දිනයේ සිට ලිත් මසක් ඇතුලත ලියාපදිංචි තැපෑලෙන් මා වෙත ඉදිරිපත් කරන ලෙස මෙයින් නියම කරමි. එම හිමිකම් පෑම් හි මතු සඳහන් කරුණු අන්තර්ගත විය යුතුයි.

(අ) ඔහුගේ/ඇයගේ නම සහ ලිපිනය :
(ආ) එම නිවාසය පිළිබඳ වූ ඔහුගේ/ඇයගේ සම්බන්ධතාවයෙහි ස්වභාවය :
(ඇ) ඔහුගේ/ඇයගේ හිමිකම් පෑමේ විස්තරය :
(ඈ) ඔහු/ඇය එම මිලෙන් හිමිකම් කියන ප්‍රමාණය :

පහලගමගේ ගාමිණී ධර්මසේන,
ජාතික නිවාස කොමසාරිස්.

නිවාස දේපල උපරිම ශාඛාව,
නිවාස සහ පොදු පහසුකම් අමාත්‍යාංශය,
සෙත්සිරිපාය, බත්තරමුල්ල.
2008 ජනවාරි මස 08 වැනි දින.

ඉහත කී උපලේඛනය

මගේ යොමු අංකය	*ප්‍රකාශකයාගේ නම සහ ලිපිනය*	*වරිපනම් අංක සහ පිහිටීම*	*දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය බලමණ්ඩලය හා කොට්ඨාස අංකය*	*මානක සැලැස්ම*	*කැබලි අංක*	*පැවරෙන ප්‍රමාණය අක්. රූඩ්. පර්. හෙක්ට් යාර්*	*උගකස්කර ඇති හෝ නැති බව*
සීඑච්/1ඒ/47 49257/244	1. කේ. ඒ. ඒ. ජයසේකර 41/6, යහම්පත් මාවත, මහරගම 2. ඒ. කේ. වී.දසනායක සුනිල් කුමාර අංක 54, හත්බෝදිය පාර, කළුබෝවිල, දෙහිවල	559, ගාලු පාර, වැල්ලවත්ත	බස්නාහිර පලාතේ කොළඹ දිස්ත්‍රිකයේ සල්පිටි කෝරලේ කොළඹ නගර සීමාව තුළ වැල්ලවත්ත කොට්ඨාසයේ අංක 47	අංක 2023 සීඑච්/1ඒ/47/ 49257/244	7706	- - 4.35	0.0011 00 -

01-732

ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා

ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය
කොළඹ විශ්වවිද්‍යාලය
2006 දෙසැම්බර් මස 31 දිනට ශේෂ පත්‍රය
(සංඛ්‍යා ආසන්නතම රුපියලට ගලපා ඇත.)

		2006 රු. ශු පො. අ.	*2005* රු. ශු. පො. අ.
ප්‍රවර්තන නොවන වත්කම්	සටහන 02		
ගෘහ භාණ්ඩ හා කාර්යාල උපකරණ		1,213,846	1,042,963
පරිගණක		773,404	303,783
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ		33,575,663	7,327,581
වැද්දුම් හා සවිකිරීම්		51,525	57,250
රසායනාගාර මෙවලම්		1,286,200	1,244,900
පුස්තකාල පොත් හා වාර ප්‍රකාශන		8,897	9,246
		36,909,535	**9,985,723**
ආයෝජන	සටහන 03	6,140,917	5,788,759
ප්‍රවර්තන වත්කම්			
අත්තිකාරම් ගිණුම		1,837,095	594,645
වෙනත් ලැබීම්	සටහන 04	280,351	-
බැංකු ශේෂ	සටහන 05	2,773,019	3,116,585
		4,890,465	3,711,230
අඩුකළා - ප්‍රවර්තන බැරකම්			
උපචිත වියදම්		706,742	631,378
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන		2,028,728	1,680,402
ආපසු ගෙවිය යුතු තැන්පතු		22,902	1,500
		2,758,372	2,313,280
ශුද්ධ ප්‍රවර්තන වත්කම්		2,132,093	1,397,950
ශුද්ධ වත්කම්		**45,182,545**	**17,172,432**
ප්‍රාග්ධනයේ මූල්‍ය සම්පාදනය කරන ලද			
වියදම් කරන ලද ප්‍රාග්ධන ප්‍රදානය		3,902,320	669,926
වියදම් නොකරන ලද ප්‍රාග්ධන ප්‍රදානය		188,767	5,027
ත්‍යාග හා පරිත්‍යාග		33,218,391	6,883,100
		37,309,477	**7,558,053**
සංචිත			
ආදායම් හා වියදම් ගිණුම		(607,238)	387,703
සීමාකරන ලද අරමුදල්			
ප්‍රදාන අරමුදල		1,165,220	1,165,220
පර්යේෂණ ප්‍රදානයන්	සටහන 06	6,565,086	8,061,456
2007 විද්‍යාපති පර්යේෂණ ව්‍යාපෘති		750,000	
		8,480,305	9,226,676
		45,182,545	**17,172,432**

ජ්‍යෙෂ්ඨ සහකාර මුදල් හාරකරු විසින් සකස්කොට සහතික කරන ලදී.
පාලක මණ්ඩලය සඳහා සහ වෙනුවෙන්,
අධ්‍යක්ෂ
සහකාර ලේඛකාධිකාරී.

2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වූ වර්ෂයේ ආදායම් හා වියදම් ගිණුම
(සංඛ්‍යා ආසන්නතම රුපියලට ගලපා ඇත)

		2006 රු.	*2005* රු.
ආදායම			
පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය		13,195,000	10,000,000
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සඳහා රජයේ ප්‍රදානය		2,000,000	800,000
ප්‍රදානය කරන ලද වත්කම් ක්‍රමක්ෂය කිරීම		7,631,253	
පර්යේෂණ ප්‍රදානයන්	සටහන 07	4,538,782	6,308,197
ඉපැයූ ආදායම	සටහන 08	1,346,512	1,609,650
වෙනත් ආදායම්	සටහන 09	486,646	293,239
	29,198,193	19,011,086	
අඩුකළා - වියදම් :			
පුද්ගල පඩිනඩි	සටහන 10	6,890,021	4,104,958
අනෙකුත් පරිපාලන වියදම්	සටහන 11	418,207	1,780,247
සැපයුම්	සටහන 12	4,945,816	2,659,750
නඩත්තු වියදම	සටහන 13	3,022,040	2,969,425
කොන්ත්‍රාත්ගත සේවා	සටහන 14	6,260,767	5,719,849
වෙනත් පුනරාවර්තන වියදම්	සටහන 15	424,743	179,836
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන	සටහන 16	348,326	1,680,402
ක්ෂයවීම්		8,160,337	199,795
		30,470,256	19,294,261
වියදමට වැඩි ආදායම් අතිරික්කය		**(1,272,063)**	**(283,175)**
ආදායම් හා වියදම් විසර්ජන ගිණුම :			
ආදායම් හා වියදම් ගිණුමෙන් ඉ/ගෙ. ශේෂය		(1,272,063)	(283,175)
ආදායම් හා වියදම් ගිණුමෙන් ඉ/ගෙ. ශේෂය		387,703	4,843,716
කලින් වර්ෂය සම්බන්ධයෙන් ගැලපීම්		277,122	4,172,838
ශේෂ පත්‍රයට ඉ/ගෙ. ශේෂය		**(607,238)**	**387,703**

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සටහන්

වැදගත් ගිණුම් ප්‍රතිපත්ති

(1) *ගිණුම් තැබීමේ ප්‍රතිපත්ති* :
මූල්‍ය ප්‍රකාශන සකස් කරනු ලැබ ඇත්තේ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරවරුන්ගේ ආයතනය විසින් හඳුන්වා දෙන ලද පොදුවේ පිළිගැනෙන ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම් ප්‍රමිතීන්ට අනුකූල වන පරිදි ඓතිහාසික ගිණුම් තැබීමේ පදනම මතය.

වත්කම් සහ ඒවායේ වටිනාකමේ පදනම

2.1 *ප්‍රවර්තන නොවන වත්කම්වල ක්ෂයවීම* :
ස්ථාවර වත්කම් දක්වනු ලැබ ඇත්තේ සමුච්චිත ක්ෂයවීම අඩුකර පිරිවැයට ය. වර්ෂයකට පහත දැක්වෙන ප්‍රමාණයන්ගෙන් සෘජු රේඛීය ක්‍රමයක් මත ක්ෂයවීම් අඩු කරනු ලැබේ.

වැද්දුම් සහ සවිකිරීම්	10%
කාර්යාල භාණ්ඩ සහ උපකරණ	10%

පරිගණක	20%
රසායනාගාර සහ ඉගැන්වීමේ උපකරණ	20%
පුස්තකාල පොත් සහ වාර සඟරා	20%
රසායනාගාර මෙවලම්	20%

මිලදී ගැනීමේ වර්ෂයේ දී ක්ෂයවීම් අඩු නොකරනු ලබන අතර බැහැර කිරීමේ වර්ෂයේ දී සම්පූර්ණ වර්ෂයක ක්ෂයවීමක් අඩු කරනු ලැබේ.

2.2 SAREC ප්‍රදානය යටතේ ලැබී කොළඹ විශ්වවිද්‍යාලයෙන් මාරු කරන ලද ස්ථාවර වත්කම්, ප්‍රතිතක්සේරු මුදල අනුව දක්වන ලදී.

2.3 *ක්‍රමක්ෂය කිරීම* :

ත්‍යාග සහ වත්කම් සඳහා පරිත්‍යාගයන් දක්වා ඇත්තේ එම ක්ෂයවීම් පදනමම පාදක කරගෙන, ක්‍රමක්ෂය වටිනාකම අඩු කිරීමෙන් පසු පරිත්‍යාගයේ වටිනාකමට ය.

පාරතෝෂික සඳහා ප්‍රතිපාදන

1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ශේෂපත්‍ර දිනට වසර පහක සේවයක් සම්පූර්ණ කර ඇති සියලුම සේවකයින්ගේ විශ්‍රාම පාරිතෝෂික සඳහා ගිණුම්වල පූර්ණ ප්‍රතිපාදන සලසනු ලැබේ.

4. ආදායම් හා වියදම්

4.1 *ආදායම් පිළිගැනුම*

(අ) සිසුන්ගෙන් ලැබෙන ආදායම් සහ බඳවා ගැනීමේ ගාස්තු එක් එක් පදනම මත ගණන් ගනු ලබන අතර පොළී ආදායම උපචිත පදනමක් මත ගණන් ගනු ලැබේ.

(ආ) විශේෂිත අරමුදල්වලින් සහ ප්‍රදානයන්ගෙන් ලත් ආදායම්.

පරිත්‍යාග, පර්යේෂණ ප්‍රදානවලින් සහ සපයන ලද වෙනත් සේවාවන්ගෙන් ලත් ආදායම් ඇතුළත් කර ඇත්තේ අදාළ සේවය සම්පූර්ණ කිරීමේ ප්‍රමාණයටය. මෙය වර්ෂය තුළ අදාළ වියදම් ප්‍රමාණයට සාමාන්‍යයෙන් සමානය.

5. සියලුම විදේශ මුදල් ගනුදෙනු ගිණුම්ගත කර ඇත්තේ ගනුදෙනු සිදු වූ දින පැවති විනිමය අනුපාතවලට ය.

6. ජෛව රසායන, අණුක ජෛව වේද සහ ජෛව තාක්ෂණ ආයතනයේ ගොඩනැගිලි සහ වත්කම් මිලදී ගන්නා ලද්දේ SEK මිලියන 15ක (රු. මී. 180) Sida සහන ණයක් මගින් ලද මුදල් වලින් වන අතර එය කොළඹ විශ්වවිද්‍යාලයේ (ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ණය ගැණුම්කරු) පොත්වල දැක් වේ.

අධ්‍යක්ෂ,
කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18 වගන්තිය යටතේ ව්‍යවස්ථාපිත 2003 අංක 1 දරන කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතන නියමාවලියේ 17 වගන්තිය, විශ්වවිද්‍යාල පනතේ 108(1) සහ 111 වගන්ති සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3), (4) සහ (7) උපවගන්ති සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර මෙම වාර්තාව නිකුත් කරනු ලැබේ.

1.2 *විගණන විෂය පථය*

මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළහැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරවන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගිණුම්කරන මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදාගන්නා ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරිව අනුගමනය කරන ලද්දේද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේදැයි නිගමනය කිරීම විගණනයට ඇතුළත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

2. *මූල්‍ය ප්‍රකාශන*

2.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ, ආයතනය, 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් පොත්පත් පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් මූල්‍ය ප්‍රකාශනවලට වන බලපෑම හැර 2006 දෙසැම්බර් මස 31 දිනට කොළඹ විශ්වවිද්‍යාලයට අනුබද්ධිත ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙද දැක්වෙන අයුරින් උක්ත පොත්පත්වලට එකඟව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සහ දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට සහ මූල්‍ය ප්‍රකාශන සමඟ දී ඇති සටහන් (අංක 2 සිට 16 දක්වා) වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

රු. 3,04,262ක් වූ පරිගණක යන්ත්‍ර 20% බැගින් ක්ෂය කළයුතු වටිනාකම රු. 60,852ක් වුවත් 10% බැගින් ක්ෂය කිරීම නිසා රු. 30,426ක් අඩුවෙන් ක්ෂය කර තිබුණි. මේ නිසා වර්ෂයේ වියදම රු. 30,426ක් අඩුවෙන් දැක්විණි.

2.2.2 ලැබිය යුතු ගිණුම්

"සීඩා සරෙක්" ප්‍රදාන වලින් රු. 1,85,642ක අත්තිකාරමක් විදේශීය සමාගමකට 2005 නොවැම්බර් මස 03 දින ගෙවා තිබුණ ද, එම ගෙවීමට අදාළ රසායනික අමුද්‍රව්‍ය ලබා ගැනීමට හෝ ගෙවූ මුදල ආපසු ලබා ගැනීමට සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට ද හැකිවි නොතිබුණි.

2.2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	*අනුකූල නොවීම්*
(අ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 110 වගන්තිය	2004 හා 2005 වර්ෂයන්ට අදාළ වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි. 2004 වර්ෂයට අදාළ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමුකර තිබුණේ 2006 සැප්තැම්බර් මස 28 දින දී ය.
(ආ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 153 වගන්තිය	රු. 27,000ක රඳවා ගැනීමේ බදු අඩුකර දේශීය ආදායම් කොමසාරිස් ජෙනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. රඳවා ගැනීමේ බදු වලට අදාළව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2006 නොවැම්බර් මස 17 දිනැති චක්‍රලේඛය 2006 නොවැම්බර් මස 24 වැනි දින ලැබුණු අතර චක්‍රලේඛයේ දින සිට රු. 45,000ක් (බදු හැර) පමණක් ගෙවූ බවත් එය මාසිකව රු. 50,000 හෝ වර්ෂයකට රු. 5,00,000 නොඉක්මවූ බවත් අධ්‍යක්ෂ දන්වා තිබුණි.
(ඇ) 2003 ජූනි මස 02 දින හා අංක පී‍ඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9:8:2 ඡේදය	ආයතනයේ හිටපු අධ්‍යක්ෂකට 2003 ජූනි මස 01 දින සිට 2004 ජූනි 30 දින දක්වා කාලයට රු. 1,80,000ක් වූ ගෞරවාන්විත දීමනාවක් ගෙවා තිබුණ නමුත් ඒ සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. 1990 පෙබරවාරි මස 6 දිනැති විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ අංක 422ට අනුව සිය නිත්‍ය තනතුරේ රාජකාරී වලට අමතරව ජෛව රසායන, අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනයට කළ සේවාව වෙනුවෙන් හිටපු අධ්‍යක්ෂකට ගෞරවාන්විත දීමනාවක් කළමනාකරණ මණ්ඩලයේ අනුමැතිය මත උපයන ලද ආදායම් වලින් ගෙවා ඇති බව අධ්‍යක්ෂ විගණනයට දන්වා තිබුණි.
(ඈ) රජයේ මුදල් රෙගුලාසි	
(i) මු. රෙ. 119	හිටපු අධ්‍යක්ෂකට වැඩිපුර ගෙවා තිබුණු රු. 2,32,616ක් ඔහුගේ ඉල්ලීම මත වාරික 19 කින් අයකර ගැනීමට තීරණය කර තිබුණ නමුත් ඒ සඳහා උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.
(ii) මු. රෙ. 772	අභාවිතව පැවැති කාලය හා වටිනාකම විගණනයට ඉදිරිපත් නොවුණු ඉන්වෙන්ට්‍රි විෂයයන් 9ක් අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.
(iii) මු. රෙ. 875	ඒකාබද්ධ අරමුදලින් සමාලෝචිත වර්ෂයේ දී නිලධාරියකුට ගෙවා තිබුණු රු. 1,50,000ක ආපදා ණය මුදලට අදාළ රු. 3,491ක් වූ පොළී ආදායම ආයතනයේ අරමුදලට බැර කිරීමට හා පුනරාවර්ථන ප්‍රදාන වලින් ණය ගෙවීම සඳහා භාණ්ඩාගාරයේ විශේෂ අනුමැතියක් අවශ්‍ය වුවත් එවැනි අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

2.2.4 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

1994 ජූනි 14 දින හා අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයට පටහැනිව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛ ප්‍රකාරව දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්වය වෙනුවෙන් වැටුප් හා දිරිදීමනා වශයෙන් 2006 වර්ෂයේ දී රු. 8,353ක් ද ගෙවා තිබුණි. හිලව් දීමනා සාවද්‍ය ලෙස වැටුපට එකතු කර ගණනය කිරීම නිසා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලට හා සේවක භාරකාර අරමුදලට රු. 17,505ක් වූ වැඩිපුර ගෙවීමක් ද කර තිබුණි. එසේ ම දීර්ඝකාලීන සේවා දීමනා වශයෙන් රු. 2,400ක් ද ගෙවා තිබුණි.

මෙම වැටුප් හා දීමනා ගෙවීම රජයේ නීතිරීතිවලට පටහැනි බවට රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයා හා ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්වරයා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දන්වා තිබුන නමුත් එම ගෙවීම් අඛණ්ඩව සිදුකරමින් තිබුණි.

3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

3.1. මූල්‍ය කාර්යසාධනය

3.1.1 මූල්‍ය ප්‍රතිඵල

විගණනයට ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2006 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ වැඩකටයුතුවල ප්‍රතිඵලය, පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු. 16,467,063ක ඌනතාවයක් වූ අතර, ඉකුත් වර්ෂය සඳහා අනුරූපී ඌනතාවය රු. 11,083,175ක් විය. පුනරාවර්තන වියදම් සඳහා ලැබුන රු. 15,195,000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා ඌනතාවය රු. 1,272,063ක ශුද්ධ ඌනතාවයකට පරිවර්තනය වූ අතර ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා ලැබුන රු. 10,800,000ක් වූ රජයේ ප්‍රදානය හේතුවෙන් එම වර්ෂයේ ශුද්ධ ඌනතාවය රු. 2,83,175ක් විය.

3.2 මෙහෙයුම් කාර්යසාධනය

3.2.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය තුළ විද්‍යාපති පශ්චාත් උපාධි පාඨමාලා 02ක් පවත්වා තිබුණි. 2005 හා 2006 වර්ෂයන්හි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව පිළිවෙලින් 08ක් හා 10ක් වූ අතර ඉන් 2006 වර්ෂයේදී උපාධිය සම්පූර්ණ කල සංඛ්‍යාව 03ක් විය. ඒක ශිෂ්‍ය සාමාන්‍ය පිරිවැය රු. 99,975ක් විය.

(ආ) පවත්වා තිබුණු දර්ශනපති පශ්චාත් උපාධි පාඨමාලා 05හි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 14ක් විය. ඉන් සිසුන් 03 දෙනෙකු පමණක් උපාධිය සම්පූර්ණ කර තිබුණි. පාඨමාලා කාලසීමාව පූර්ණ/අර්ධ කාලීනව වර්ෂ 03-05ක් අතර විය.

(ඇ) දර්ශනශූරී පශ්චාත් උපාධි පාඨමාලා 02ක් පවත්වා තිබුණි. එහි ලියාපදිංචි ශිෂ්‍ය සංඛ්‍යාව 02ක් වූ අතර ඉන් කිසිදු ශිෂ්‍යයකු උපාධිය සම්පූර්ණ කර නොතිබුණි. පාඨමාලා කාලසීමාව පූර්ණ/අර්ධ කාලීනව වර්ෂ 04-07 අතර විය.

(ඈ) ක්ෂේත්‍ර 10ක් ආවරණය වන පරිදි පර්යේෂණ ව්‍යාපෘති 32ක් පවත්වා තිබුණි. ඉන් 11ක පර්යේෂණ කටයුතු සම්පූර්ණ කර වාර්තා නිකුත් කර තිබුණි. ව්‍යාපෘති 21ක පර්යේෂණ කටයුතු කෙරීගෙන යමින් පවතින අතර ඉන් 06ක් 2006 වර්ෂය අවසන් වන විට නිම කල යුතු ඒවා විය. මෙම පර්යේෂණ ව්‍යාපෘති සඳහා සීඩා සරෙක් ප්‍රදාන යටතේ රු. 2,364,300ක හා වෙනත් ප්‍රදානයන් යටතේ රු. 2,171,200ක වියදමක් දරා තිබුණි.

(ඉ) පශ්චාත් උපාධි පාඨමාලා සඳහා බාහිර කථිකාචාර්යවරු 15 දෙනෙකුගේ සේවය ලබා ගෙන තිබුණු අතර ඔවුන් විසින් දේශන පැය 102ක් පැවැත්විය යුතු බවට සැලසුම් කර තිබුණ ද පවත්වන ලද දේශන පැය සංඛ්‍යාව 74ක් හෙවත් 72%ක් පමණක් විය. මෙම බාහිර දේශකයින් සඳහා දරන ලද පිරිවැය රු. 58,538ක් වූ අතර දේශන පැයක පිරිවැය රු. 791ක් විය. දේශන පැය 07ක් වෙන් කර තිබුණු බාහිර කථිකාචාර්යවරු දෙදෙනෙකු විසින් එම අදාළ දේශනයන් පවත්වා නොතිබුණු අතර අභ්‍යන්තර කථිකාචාර්යවරු 05 දෙනෙකු විසින් දේශන පැය 390ක් පවත්වා තිබුණි.

(ඊ) පෙර වර්ෂයට වඩා එක් තනතුරක් වැඩිවීම හේතුවෙන් 11 දෙනෙකුගෙන් සමන්විත වූ කාර්ය මණ්ඩලය සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 4,404,115 ක පිරිවැයක් දරා තිබීම නිසා ඒක පුද්ගල සාමාන්‍ය පිරිවැය රු. 4,00,374ක් විය. එය පෙර වර්ෂය හා සසඳන විට 73%ක වැඩිවීමකි.

3.3 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

2003 ජූනි මස 02 දින හා අංක පී‍ඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයෙහි 5.1 වගන්තිය අනුව ආයතනයේ මෙහෙයුම් කටයුතු සඳහා ඵලදායීව යොදා ගැනීමට හැකිවනු පිණිස වර්ෂ තුනකට නොඅඩු කාලපරිච්ඡේදයක් සඳහා සංයුක්ත සැලැස්මක් සහ ක්‍රියාකාරී සැලැස්මක් සකස් කළ යුතු වේ. එහෙත් ආයතනය විසින් සකස් කරන ලද සංයුක්ත සැලැස්මෙහි ආයතනයේ මෙහෙවර, පරමාර්ථ හා උපාය මාර්ග පමණක් අන්තර්ගත කිරීම හැර උක්ත චක්‍රලේඛ ප්‍රකාරව සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

පී. ඒ. පේමතිලක,
විගණකාධිපති.

2007 සැප්තැම්බර් මස 11 වැනි දින,
විගණකාධිපති,
විගණකාධිපති දෙපාර්තමේන්තුව,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

මහත්මයාණනි,

2006 දෙසැම්බර් දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108(2) වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

ඉහත වාර්තාව 2007 සැප්තැම්බර් මස 10 වැනි දින පවත්වන විගණන කමිටුව විසින් සාකච්ඡා කරන ලද අතර එහි පෙන්වා ඇති අඩුපාඩු නිවැරදි කර ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග පහත සඳහන් කර ඇත.

2.2.1 ගණකාධිකරණ අඩුපාඩු

2007 වර්ෂයේ ආරම්භයෙදී පෙර වර්ෂයේ ගැලපුමක් ලෙස පහත ජනල් සටහන මගින් නිවැරදි කර ඇත. (ජනල් සටහන් අංක 01)

ආදායම් වියදම් ගිණුම	හර	30,428
පරිගණක ක්ෂය වෙන් කිරීමේ ගිණුම		30,426

2.2.2 ලැබිය යුතු ගිණුම

ඇණවුම් කල රසායනික ද්‍රව්‍ය අවශ්‍ය කාලසීමාව තුළ නොලැබූ නිසා ගෙවූ අත්තිකාරම් මුදල් ආපසු ගෙවන ලෙස දැනුම් දෙන ලදී.

මුදල් අප වෙත ලැබීම ප්‍රමාද වූයේ ඉන්දියානු බැංකු හරහා ප්‍රේෂණය කරන ලද මුදල් යැවීමේ පවතින නීතිරීති නිසාය.

2007 අප්‍රේල් මස 27 දින අප ගිණුම් අංක 086100151189712 වෙත ඉහත මුදල රු. 1,92,432 ක් ලැබී ඇත. අදාළ මුදල් ලැබීම බැංකු නිවේදනයේ පිටපතක් අමුණා ඇත. (ඇමුණුම 1)

2.2.3 නීති, රීති රෙගුලාසි හා කළමාණකරණ තීරණවලට අනුකූල නොවීම

(අ) පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා 2004 සහ 2005 වාර්ෂික වාර්තා පහත සඳහන් දිනවල උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට භාර දී ඇත.
2004 වාර්ෂික වාර්තාව - 2006 සැප්තැම්බර් මස 26 වැනි දින
2005 වාර්ෂික වාර්තාව - 2007 මැයි මස 28 වැනි දින
කිහිප අවස්ථාවක සිහිගැන්වීම් සිදු කළද මේ දක්වා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා අවශ්‍ය අමතර පිටපත් අවශ්‍ය කරන දිනය අප වෙත දැනුම් දී නොමැත.

(ආ) සටහන් කර ගතිමි.

(ඇ) සටහන් කර ගතිමි.

(ඈ) රජයේ මුදල් රෙගුලාසි

(i) 2007 මැයි මස 06 වැනි දින අදාළ අයකර ගැනීම සඳහා උසක් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්ගේ ආවරන අනුමැතිය ලබාගන්නා ලදී. ආවරන අනුමැතිය ලබා දුන් ලිපියේ පිටපතක් අමුණා ඇත. (ඇමුණුම II) 2007 අගෝස්තු මස 25 වැනි දින වන විට අඩුකළ යුතු ඉතිරි මුදල රු. 12,242 කි.

(ii) 2007 ජූනි මස 21 වැනි දින පැවති පාලක මණ්ඩල රැස්වීමේදී අභාවිත අයිතම 9 වෙන්දේසියේ විකිණීමට තීරණය කරන ලදී. තව ද එම අයිතම් සඳහා වෙනම වෙන්දේසියක් පැවැත්විය

නොහැකි බැවින් කොළඹ විශ්වවිද්‍යාලයේ එවන් වෙන්දේසියක් පවත්වන අවස්ථාවක අප අයිතමද වෙන්දේසි කිරීමට තීරණය කරන ලදී.

(iii) ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය 2004 වසර තුළ ආරම්භ කල අතර කාර්ය මණ්ඩලය සඳහා හදිසි ආපදා ණය මුදල් ලබාදීම සඳහා ප්‍රමාණවත් අරමුදලක් ආයතනය තුළ නොමැති නිසා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කල චක්‍රලේඛන වලට අනුව අදාළ ණය මුදල් ගෙවන ලදී.

2.2.4 දෙවන හා තෙවන භාෂා ප්‍රවීනත්ව දීමනා සහ දීර්ඝකාලීන සේවා දීමනා ගෙවීම සහ හිලව් දීමනා සඳහා විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල් ගෙවීම සිදු කරන ලද්දේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් නිකුත් කළ චක්‍රලේඛන වලට අනුවය.

3.1.1 සටහන් කර ගතිමි.

3.2.1 කාර්ය සාධනය

(අ) සියළුම පශ්චාත් උපාධි පාඨමාලා වර්ෂ 1 1/2 වැඩි කාලසීමාවක් ගත වන බැවින් සහ දර්ශනපති පශ්චාත් උපාධි පාඨමාලා සඳහා ඒක ශිෂ්‍ය වාර්ෂික සාමාන්‍ය පිරිවැය රු. 99,975 කි.

(ආ) සටහන් කර ගතිමි.

(ඇ) ජෛව රසායන අණුක ජෛවවේද හා ජෛව තාක්ෂණ ආයතනය ආරම්භ කරන ලද්දේ 2004 වර්ෂය තුළදී නිසා 2006 අවසාන වන විට දර්ශනශූරි පශ්චාත් උපාධි පාඨමාලා කාලසීමාව අවසන්වී නොමැත.

(ඈ) 2006 වසර තුළ නිමකල යුතු පර්යේෂණ වාර්තා 6ක් අවසන් කිරීමට නොහැකි වූයේ එකී වාර්තාවල අධීක්ෂකයන් විසින් පෙන්වා දුන් නිවැරදි කිරීම් සිදු කිරීමට තිබූ නිසාය.

(ඉ) පැවැත්විය යුතු දේශන පැය ගණනට ට්‍යුටෝරියල් සහ ප්‍රායෝගික පන්ති පැය ගණන ඇතුළත් වීමත්, සමහර දේශන 2007 ජනවාරි/පෙබරවාරි මාසවල පැවැත්විය යුතු ඒවා වීමත් මෙම විෂමතාවයට හේතුවිය.

(ඊ) 2005 වර්ෂය අවසාන වන විට කාර්ය මණ්ඩලය 10 දෙනෙකුගෙන් සමන්විත විය. 2005 ආරම්භය වන විට කාර්ය මණ්ඩලය දෙදෙනෙකුට පමණක් සීමා විය. ඉතිරි 08 දෙනා 2005 වසර තුළ පත්කළ අතර ඉන් 04 දෙනෙකු පත්කර ඇත්තේ 2005 නොවැම්බර් සහ දෙසැම්බර් මාස වලය.

නමුත් ඉහත කාර්ය මණ්ඩලයේ 10 දෙනා හටම 2006 වසර තුළ සම්පූර්ණ කාලපරිච්ඡේදය සඳහා වැටුප් ගෙවා ඇත.

ඒක පුද්ගල සාමාන්‍ය පිරිවැය 73%ක වැඩිවීමත් පෙන්නුම් කරනුයේ ඉහත කරුණු නිසාය.

3.3 සංයුක්ත සැලැස්ම සහ ක්‍රියාකාරී සැලැස්ම

ආයතනය විසින් පීඊඩී 12ට අනුව 2007-2011 කාලසීමාව සඳහා සංයුක්ත සැලැස්මක් හා ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර පාලක මණ්ඩලය විසින් අනුමත කර ඇත.

දැනට මුද්‍රණය සඳහා යොමුකර ඇති අතර මුද්‍රණය අවසන් කල වහාම පිටපතක් ලබාදීමට කටයුතු කරමි.

මහාචාර්ය කමනි එච්. තෙන්නකෝන්,
අධ්‍යක්ෂ.

පිටපත

01. කේ. සී. පී. සේනාරත්න මහත්මිය,
විගණන අධිකාරී,
රජයේ විගණන අංශය,
කොළඹ විශ්ව විද්‍යාලය
02. ලේකම් - උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
03. ලේකම් - මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය
04. සභාපති - විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව
05. උපකුලපති - කොළඹ විශ්වවිද්‍යාලය

01-676

විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථාව

(කලින් කල සංශෝධිත) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 04 වන වගන්තිය යටතේ වූ යෝජනා සම්මුතිය.

ණය අංකය : 03/0/33/00242.

ණයකරුගේ සම්පූර්ණ නම : දිසානායක මුදියන්සේලාගේ අශෝක පුෂ්ප කුමාර දිසානායක

